

# කෝච්චියෙන් සවාරියක්..

කතෘ : සුලක්ඛනා තෙන්නකෝන්

**කතෘ - සුලක්ඛනා තෙන්නකෝන්**

**කතෘගේ වෙනත් කෘති -**

මාළුවා සහ ධීවරයා 2020.

රිළා පැංචාට තෑග්ගක් 2023.

කෝච්චියෙන් සවාරියක් 2024.

පාසල : මහ / මහාමායා බාලිකා විද්‍යාලය.

ඉගෙනුම ලබන පන්තිය : 5 ශ්‍රේණිය E .

කෘතිය පළකළදිනය : 2025.02.08

**I.S.B.N 9786242088143**

# පිදුම

මෙම පොත සෑදීමට

මාහට නිරතුරුවම උපදෙස් ලබාදුන්

මා දිරිමත්කල මාගේ දෙමව්පියන්ටත්,

මාගේ පන්තිභාර ගුරුතුමාටත්

මෙම පොත

ඉතා ආදරයෙන් පිළිගන්වමි.

🙏

සුලක්ඛණා . එම් .පී තෙන්නකෝන්.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය


විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර




දෙසැම්බර් පාසල් නිවාඩු කාලයේ බදුල්ල බලා යාමට අප පවුලේ සැමදෙනා තීරණය කළෙමු. එයට සහභාගී වූයේ අම්මා,අප්පච්චි, මල්ලී,මම, කිරිඅම්මා,චූටි මාමා, නැන්දා සහ අක්කලා දෙදෙනායි. මමයි ,අම්මායි, අප්පච්චියි මල්ලී දුම්රියෙන් බදුල්ල බලා යාමට තීරණය කළෙමු. අනිත් අය මාමාගේ මෝටර් රථයෙන් එන බව පැවසීය. අප පළමුව ගියේ පිළිමතලාව දුම්රිය ස්ථානයටය අපේ අම්මාට හිමි නිදහස් ගමන් බලපත්‍රයට හිමි ටිකට්පත් දුම්රිය ස්ථානාධිපති විසින් ලබා දෙන ලදි. එවිටම කොළඹ කොටුවේ සිට පැමිණෙන පොඩි මැණිකේ දුම්රිය තව ස්වල්ප වේලාවකින් පැමිණෙන බව නිවේදනය කරන ලදි. සුලු මොහෙතකින් විශාල සෙනගක් සමග දුම්රිය ස්ථානයට අවා දුම්රිය නැවැත්වීමෙන් පසු අපට දෙවෙනි පංතියට අයත්දුම්රියේ පෙට්ටියකට ගොඩවුණි. වෙන්කළ ආසන නිසා අපට ආසනයක් ලැබුණි. එයමල්ලීටයි මටයි නව අත්දැකීමකි.




දුම්රිය ගමන ආරම්භකර  විනාඩි පහළෙවකටපමණ පසු පළමුව පැමිණියේ පේරාදෙණිය දුම්රිය ස්ථානයටයි  පසුව සරසවි උයන මහනුවර දුම්රිය ස්ථාන වලට පැමිණියේය. මහනුවර දුම්රිය ස්ථානයේදී මිනිසුන් බැසගියත් විදේශීය සංචාරකයින් හා අපරටේ විශාල පිරිසක් දුම්රියට නැගීම නිසා අධික තදබදසහිතව මහනුවර දුම්රිය ස්ථානයෙන් පිටත්විය.


පසුව,පේරාදෙනිය,ගෙළිඔය,ගම්පොල,නාවලපිටිය,ග ල්බොඩ මෙම දුම්රිය ස්ථානයට ටිකක් දුරින් ලස්සන දිය ඇල්ලක තිබෙන බවද අප්පච්චී කීවේය වෙනත් දිනක එයද නැරඹීමටයාමටබලාපොරොත්තුවෙමි.



ඉන්පසුවටවල,ඉහලවටවල,රොසැල්ල,හැටන්කොටගල,තලවාකැලේ යන දුම්රිය ස්ථාන පසු වන විට දැක ගැනිමට හැකිවුයේ ලස්සන තේ වතු මැදින් තේජාන්විතව දුම දමමින් සීතල සුළං මීදුම කපාගෙන ආපේ ඇග සීතල කරමින් ඉදිරියට ඇදෙන දුම්රියයි. සීරීපාද කන්දද ඈතින් අපට විටින් විට දිස්වන්නට විය හිරු පායා තිබු නිසා පැහැදිලිව දැකබලා ගැනීමට හැකිවිය.පසුව නානුඔය දුම්රියස්ථානයට පැමිණි පසු සිරීපාදයට යාමට පැමිණිවිශාල පිරිසක්සහ විදේශීය සංචාරකයින්ද දුම්රියෙන් බැසගියහ.




පසුවනැවතත් තේවතු මැදින් කන්ද තරණය කරමින් සෙමෙන් සෙමින් හෙමින් ඉදිරියට ඇදෙමින්ගිමන්හරින්නාක්මෙන්කොටගල,තලවාකැලේ,වටගොඩ,ග්‍රේඩ්වෙස්ට්,රදැල්ලයන දුම්රිය ස්ථානවල නවත්වාගෙන බදුල්ල සිට එන දුම්රියන් වලට ඉඩදෙමින් පස්වරු එක පමණ වනවිට නානුඔයට ලගාවිය පසුව අඹේවෙලට කිරිගොවිපලද ලස්සනට පිටතින් දැකබලා ගැනිමට හැකිවිය. හිරුපායා තිබුණද අඳුරු ස්වභාවයත් මිදුමත් නිසා ඇගේ හිරිගඩු පිපෙන තරමට සීතල ගතියෙන් අප පට්ටිපොළ පසුකර ඔහියට ලගා විය.ලෝකාන්තය බැලිමට යන සංචාරකයින් මෙම දුම්රියෙන් බැස යනලදි.



දැන් එන්න එන්නම දුම්රියේ තදබදයද ටික ටික අඩුවෙන බවත් අප සිටි ස්ථානයේ සිට බැලුවිට දුම්රියේ පසුපස තෙක් පැහැදිලිව දිස්විය. සමහර වංගු සහිතව ගමන් කරන විට විශාල සර්පයෙක් වනාන්තරය මැදින් ඇදෙන ආකාරය සිහියට නැඟිණ.පසුව ලංකාවේ ලස්සනම දුම්රිය ස්ථානය වන ඉදල්ගස් හින්නට ලගාවිය  එය ලංකාවේ මුහුදු මට්ටමෙන් ඉහළම දුම්රිය ස්ථානය බවද මගීන් කථාවෙන බව ඇසුණි.



ඉන්පසු හපුතලේ කන්ද තරණය කරමින් දියතලාව දුම්රිය ස්ථානයට අවා.මෙම  දුම්රිය ස්ථානයේ වැදගත් කමනම් අපරටේ යුද හමුදාවට ආධුනික කමිෂන්ලත් ශිෂ්‍ය භට නිළධාරීන් පුහුණුව ලබන මිලිටරි ඇකඩමිය පිහිටා තිබෙන්නේ මෙම නගරයේ බවත් එය එහි පිහිටුවීමට හේතුව හොද ඔක්සිජන් ප්‍රතිශතයක් යුක්ත පිහිටි ප්‍රදේශයක් බව අප්පච්චීගෙන් විස්තර අසා දැන ගතිමි.



බණ්ඩාරවෙල පසුකර තවත් දුම්රිය ස්ථාන කිපයක් පසුකර ඇල්ල දුම්රිය ස්ථානයට ළඟාවිය. එය සංචාරක පුරවරයකි.එය තේරුම් ගත හැකිවන්නේ දුම්රිය නතර කලපසු අපත් තවත් කීපදෙනෙකු පමනක් ඉතිරිකර දුම්රියේ සියලූ ආසන හිස්වී දුම්රියේ ඉදිරිපස පෙට්ටියේ සිට පසුපස පෙට්ටිය දක්වා මල්ලී,මමයි එහා මෙහා දුවන්නට පටන්ගත්පසුය. ආම්මාත් අප්පච්චිත් එයට ඉඩදී බලාසිටි අතර අප දෙදෙනා ඇතිතරම් විනෝද වුනි.




පසුව දෙමෝදර රේල් ගැටය මට විස්මිත අත්දැකීමකි කන්දක් නැගීම සඳහා හිසට බඳින සුඹුරයක් ආදර්ශකර බ්‍රිතාන්‍ය ජාතිකයන් මෙම රේල්පාර සකස්කර ඇතිබව කරුණු පැහැදිලි කරන අතරතුර දැනගතිමි.දුම්රිය ස්ථානය පසුකර දුම්රිය කවුලුවෙන් ඉහල බැලූවිට එය මනාව දිස්වෙයි.පසුව දේමෝදර පාළමද දැක බලාගනිමින් අප තවත් දුම්රිය ස්ථාන දෙකක් වන උඩුවර සහ හාලි ඇල දුම්රිය ස්ථානය පසුකර පස්වරු පහ පමණවනවිට බදුල්ල දුම්රිය ස්ථානයට පැමිණියමු දැඩි වෙහෙසකාරී ගමනක් වුවද නැවුම් අත්දැකීම් ගොඩාක් ලබා ගනිමින් සතුටින් දුම්රියෙන් බැස ගතිමි.



දුම්රියට මහත් වෙහෙසකර ගමනක් වුවද එයද ගිමන් හැර පසුදින උදෑසන අටයි තිහට කොළඹ බලා ධාවනය වනබව අප්පච්චී පැවසුවේය .පස්වරු හයට බදුල්ලෙන් පිටත්වීමට නියමිත රාත්‍රී තැපල් දුම්රියද පණගන්වා හඬ නගමින් වේදිකාවේ නවතා අයුරුද එයට ගොඩවී ආසනද නිදන මැදිරිද නැරඹීමට අවස්ථාවක් ලබාගැනීමටද තැපැල් දුම්රියෙන් වෙන සේවයද පැහැදිලිව දැන ගැනීමට හැකිවූයේ අප්පච්චී මිතුරකු දුම්රියේ සේවය සඳහා එදින බදුල්ල රාත්‍රී දුම්රියේ සේවයේ යේදී සිටි නිසාය.පසුව දුම්රියට ස්ථානයෙන් පිටතට පැමිණි පසු ලොකුමාමා අපව රැගෙන යාමට මෝටර් රථයෙන් දුම්රිය ස්ථානයයේ පිටත අප එනතෙක් බලා සිටියාය



අපට පසුව නුවර සිට පැමිණි කිරිඅම්මා,චුටි මාමා, නැන්දා සහ අක්කලා දෙදෙනා අපට කලින් පැමිණ සිටියා. දුම්රිය වැඩිවේලාවක් ගත්තද එය විශාල අත්දැකීම් ගෙන දෙන ගමනකි. එදින අප ලොකුමාමාගේ නිල නිවසේදී රාත්‍රිය ගතකර පසුදින දෙමෝදර, පාළම සහ ඇල්ල සංචාරක පුරවරයද ඇලයින් රාවණා නම් සංචාරකයින් සදහා ඉදිකොට ඇති ස්ථානයද නරඹමින් කිසිදා අමතක නොවන දුම්රිය ගමන ආපසු නිවස බලා දුම්රියෙන්ම පැමිණීමෙන් පසු නිමා කරන ලදි. මාගේ පළමු දීර්ඝතම දුම්රිය ගමන කිසිදා අමතක නොකරමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි  මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය  මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

**ISBN9786242088143**